සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## ලකුණු දීමේ පටිපාටිය



Department of Examinations - Sri Lanka

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
### ලකුණු දීමේ පටිපාටිය

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | - | 1 x 40 | | = ලකුණු 40 |
| II පත්‍රය | - | | | |
| 01. ප්‍රශ්නය | - | 2x 10 | = ලකුණු 20 | |
| 02. ප්‍රශ්නය | - | | = ලකුණු 25 | |
| 03. ප්‍රශ්නය | - | | = ලකුණු 10 | |
| 04. ප්‍රශ්නය | - | | = ලකුණු 10 | |
| 05. ප්‍රශ්නය | - | | = ලකුණු 15 | |
| | | එකතුව | = ලකුණු 80 | |
| | | | | = ලකුණු 80 |
| III පත්‍රය | - | | | |
| 01. ප්‍රශ්නය | - | 2 x 10 | = ලකුණු 20 | |
| 02. ප්‍රශ්නය | - | 4x 5 | = ලකුණු 20 | |
| 03. ප්‍රශ්නය | - | | = ලකුණු 15 | |
| 04. ප්‍රශ්නය | - | | = ලකුණු 15 | |
| 05. ප්‍රශ්නය<br>06. ප්‍රශ්නය<br>07. ප්‍රශ්නය | | එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු යි. | = ලකුණු 10 | |
| | | එකතුව | = ලකුණු 80 | |
| | | | | = ලකුණු 80 |

Department of Examinations - Sri Lanka

### අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රයට ලකුණු | = | 40 |
| II පත්‍රයට ලකුණු | = | 80 |
| III පත්‍රයට ලකුණු | = | 80 |
| එකතුව | = | 200 |
| අවසාන ලකුණු | = | 200÷ 2 |
| | = | 100 |

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ....................................................<br>....................................................<br>.................................................... | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ....................................................<br>....................................................<br>.................................................... | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ....................................................<br>....................................................<br>.................................................... | √ | △ $\frac{3}{5}$ |
| (03) | එකතුව | → | □ $\frac{10}{15}$ |

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

Department of Examinations - Sri Lanka

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :-** **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

Department of Examinations - Sri Lanka

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## අභිමතාර්ථ
## I පත්‍රය

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහි දී අපේක්ෂකයන්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## IIපත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි.

1 ප්‍රශ්නය කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය, ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති විස්තරවලින් එකක් තෝරාගෙන ඒ යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

3 ප්‍රශ්නය සාරාංශකරණය යි. දී ඇති ඡේදය සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයන්ගේ සංශ්ලේෂණ හැකියාව මෙන් ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහි දී පරීක්ෂා කෙරේ.

4 ප්‍රශ්නය අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා දෙනලද ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

5 ප්‍රශ්නයේ දී අපේක්ෂකයන් විවිධ ප්‍රායෝගික ලේඛන ලිවීමෙහි ලා දක්වන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ පුවත්පත් වාර්තාවක් ලිවීම ය. එහි ම අනෙක් ප්‍රශ්නය වනුයේ වෙළෙඳ දැන්වීමක් සකස් කිරීම යි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි භාවිත වන විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත්ගන්නා පරිදි ලියා දැක්වීම පිළිබඳ අපේක්ෂකයන්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

Department of Examinations - Sri Lanka

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහි දී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල විමර්ශනාත්මක අවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමට යි.

3, 4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක,විචාරාත්මක හා තර්කානුකූල දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමු වෙයි.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂකයන් සතුව පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීම යි.

සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර, අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතු ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II**
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** මුළු රට ම **දෙබරයට ගල් ගැසුවාක් මෙන්** ඇවිළී ගියේ ය.
(1) මහා විනාශකාරී ස්වරූපයකින්
(2) නොසිතූ ආකාරයේ අනතුරකින්
(3) කලින් සැලසුම් කළ ක්‍රියාවකින්
(4) අනපේක්ෂිත ආකාරයේ නොසන්සුන්කමකින්

**2.** රෝගියා ජීවත් වූයේ **වළ පයක් ගොඩ පයක් තබා ගෙන** ය.
(1) දැඩි පීඩනයකින්		(2) දැඩි අසහනයකින්
(3) දැඩි පිළිකුලෙන්		(4) දැඩි අවිනිශ්චිතතාවකින්

**3.** කමල් සහ නිමල් කටයුතු කළේ **නයින් පොළොඟුන් සේ** ය.
(1) ඉතා අවිශ්වාසයෙන්		(2) දැඩි අප්‍රසාදයෙන්
(3) අධික වෛරයෙන්		(4) මහත් සැකයෙන්

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** තමා අතින් වරදක් සිදු වූ අවස්ථාවක වඩාත් යෝග්‍ය වනුයේ ස්වයං ................................ යෙදීම ය.
(1) අධීක්ෂණයක	(2) නිරීක්ෂණයක	(3) පරීක්ෂණයක	(4) විවේචනයක

**5.** ප්‍රතිභාපූර්ණ නිර්මාණකරුවකුගේ වැදගත් ලක්ෂණයක් වන්නේ ....................................... භාෂාවක් භාවිත කිරීම යි.
(1) ගූඪාර්ථවත්	(2) ව්‍යංග්‍යාර්ථවත්	(3) නිශ්චිතාර්ථවත්	(4) සංගයාර්ථවත්

**6.** ලබන සතියේ කාලගුණ තත්ත්වය පිළිබඳ කාලගුණ විද්‍යාඥයා ................................... යෙදෙයි.
(1) කථෝපකථනයක	(2) පුරෝකථනයක	(3) විමර්ශනයක	(4) සමාලෝචනයක

7. සැම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) ළසඟ, ශබ්ධය, දෘෂ්ටිපථය, කෙළවර
   (2) කල්‍යාණ, දර්ශණීය, වනවදුල, වර්තමාන
   (3) වීරෝධාර, සමුච්ඡය, ස්තූපය, සුලකළ
   (4) නිදර්ශන, දර්පණ, ධර්මිෂ්ඨ, විශිෂ්ට

8. 'කාක්කා, කුලය, කීර්තිය, කැකිරි' යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) ඇලපිල්ල, කෙටි පාපිල්ල, දිගු ඉස්පිල්ල හා කෙටි ඇදපිල්ල
   (2) කෙටි පාපිල්ල, දිගු ඉස්පිල්ල, ඇලපිල්ල හා කෙටි ඇදපිල්ල
   (3) ඇලපිල්ල, දිගු ඉස්පිල්ල, කෙටි පාපිල්ල හා කෙටි ඇදපිල්ල
   (4) දිගු ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල හා ඇලපිල්ල

9. 'ධනපති' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්‍ෂර වර්ග වනුයේ,
   (1) දන්තජ හා මූර්ධජ ය.
   (2) කණ්ඨජ හා දන්තජ ය.
   (3) දන්තජ හා ඕෂ්ඨජ ය.
   (4) තාලුජ හා ඕෂ්ඨජ ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
   (1) ඉතාලිය, බ්‍රිතාන්‍යය, ජර්මනිය, සුඩානය
   (2) ඉන්දියාව, කොරියාව, චීනය, ජපානය
   (3) ඉන්දුනීසියාව, සිරියාව, රුසියාව, ටිබෙටය
   (4) ඉතියෝපියාව, අමෙරිකාව, බ්‍රසීලය, ග්‍රීසිය

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   (1) සතුරකු, බැල්ලියක්, සිවලකු, මිනිසෙක්
   (2) නීතිඥයෙක්, වෙළෙන්දෙක්, දාසයකු, වනිතාවක්
   (3) ධනපතියකු, සිඟන්නකු, දරුවකු, ළදැරියක
   (4) රෝගියෙක්, රියැදුරකු, ශිෂ්‍යාවක, වැඳිරියක්

12. "කුරුල්ලෝ සන්ධ්‍යා කාලයේ අහසෙහි පියාසර කරති' යන වාක්‍යයේ '**අහසෙහි**' යන්නෙහි විභක්තිය කුමක් ද?
   (1) කරණ (2) කර්තෘ (3) අවධි (4) ආධාර

13. 'නවනිවෙස' යන්න අයත් වන්නේ,
   (1) විශේෂණ සමාසයට ය.
   (2) විභක්ති සමාසයට ය.
   (3) අව්‍යය සමාසයට ය.
   (4) අන්‍යාර්ථ සමාසයට ය.

14. 'සංවත්සර + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   (1) සංවත්සරික (2) සාංවත්සරික (3) සාංවාත්සරික (4) සංවාත්සරික

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
   (1) සමාස - හුඹස්කට, රෝබිය, රියසක, බලුවලිගය
   (2) අසම්භාව්‍ය ක්‍රියා - ගයත, නියත, වයත, දුවත
   (3) සන්ධි - වංශාධිපති, අනියමාර්ථ, දේවාශීර්වාද, ව්‍යවස්ථානුකූල
   (4) නිපාත - මෙන්, නිසා, තෙක්, වහා

16. **මිශ්‍ර ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) ඔහු සෙමින් කතා කළේ ය.
   (2) ඈ ඔහු හා පෙමින් වෙළී සිටියා ය.
   (3) වඳුරා මඳ දුරක් බිමින් ගමන් ගත්තේ ය.
   (4) ගෙවිලිය ගොයම් කපමින් ගීයක් ගැයුවා ය.

● අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. **සෝදාහරණ ව** කරුණු දක්වන්න.
   (1) තමා උදාහරණ කොටගෙන
   (2) උදාහරණ රහිත ව
   (3) එක් උදාහරණයක් සහිත ව
   (4) උදාහරණ සහිත ව

Department of Examinations - Sri Lanka

**18.** එය **වෘත්තීයාභිමුඛ** පාඨමාලාවකි.
(1) රැකියාවකට අවධානය යොමු කළ (2) රැකියාවක් කැමැත්තෙන් කරන
(3) රැකියාවක් අරමුණු කරගත් (4) රැකියාවක් ලබා ගැනීම සඳහා පමණක් වූ

**19.** **විජයාගමනය** ලංකා ඉතිහාසයේ වැදගත් සිදුවීමකි.
(1) විජයගේ පැමිණීම (2) විජයගේ ආක්‍රමණය
(3) විජය රටින් පිට ව යාම (4) විජයගේ පිටත් වීම

**20.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) වේල්ල, ජලාශය, කුඹුර, ඇළ
(2) ගවුම, කලිසම, සපත්තුව, අත් ඔරලෝසුව
(3) කියත, නියන, යතුකැටය, ගඩොල්
(4) කතුර, නූල් පන්දුව, ඇඳුම, ඉදිකටුව

**21.** එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | පාද - බාහු, | නාදය - හඬ, | කන - කර්ණය, | පක්ෂියා - විහඟ |
| (2) | තාත්තා - පියා, | මිත්‍රයා - මිතුරා, | බල්ලා - සුනඛයා, | දත් - දසන් |
| (3) | තරුණයා - වැඩිහිටියා, | හඳ - චන්ද්‍රයා, | ගල - ශෛල, | සුළඟ - පවන |
| (4) | ස්ත්‍රිය - වනිතාව, | මහල්ලා - වෘද්ධයා, | නරියා - හිවලා, | පුෂ්පය - මහනෙල් |

**22.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) පර්වතය - කන්ද, ගිරි, පව්ව, මුදුන (2) ඇස - නයන, නුවන, නේත්‍රය, අක්ෂි
(3) පද්මය - පියුම, සරෝජ, සියපත, නෙලුම (4) අහස - ගුවන, ආකාශය, නුබ, ගගන

**23.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) ආමිෂ - නිරාමිෂ (2) අන්ත - අනන්ත
(3) උත්තම - අධම (4) ආදර - සමාදර

**24.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'තෝ' යන්නෙහි ස්ත්‍රී ලිංග රූපය 'තී' යන්න යි.
(2) 'අවප්‍රමාණ' යන වචනයෙහි 'අව' යනු උපසර්ගය යි.
(3) සඤ්ඤක අක්ෂර, අර්ධ අනුනාසික යන නාමයෙන් ද හැඳින්වේ.
(4) 'යමු' යන්න වර්තමාන කාල, උත්තම පුරුෂ, ඒක වචන ආඛ්‍යාත පදයකි.

**25.** පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) සාහිත්‍ය කලා සංවර්ධනය තුළින් සමාජ ප්‍රගමනයට හේතු වෙයි.
(2) අනාගත ශිෂ්‍ය ප්‍රජාවගේ අභිවෘද්ධිය තකා සියලු සැලසුම් සකස් කළ යුතු ය.
(3) අසීමාන්තික වස්තු ලෝභය සදාචාර සම්පන්න පුද්ගල සංවර්ධනය දියුණු කරයි.
(4) වර්තමාන කාලීන අවශ්‍යතාවලට අනුව අතීතයෙහි සිටි පාලකයන් ක්‍රියා කර ඇත.

- අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

**26.** යමක් කියනවාට වඩා ක්‍රියාත්මක කිරීමේ දී වෙනස් වන බව
(1) කතාව දෝළාවෙන් ගමන පයින්
(2) ආඳමාළු ඉරට්ටෙන් කන්නා වාගේ
(3) කටින් බතල කොළ හිටවනවා වාගේ
(4) අබරා සිල්ගත්තා වාගේ

**27.** ඉතා කැමති දෙයක් අකමැති සේ හැඟවීම
(1) වක්කඩෙහි හකුරු හංගනවා වාගේ
(2) පනින රිළවුන්ට ඉණිමං තියනවා වාගේ
(3) ඉබ්බා දියට දමන විට ඇන්නැවෙ කිව්වා වාගේ
(4) අඬන්න ඉන්න මිනිහාගේ ඇහැට ඇඟිල්ලෙන් අනිනවා වාගේ

Department of Examinations - Sri Lanka

**28.** ස්වරාදේශ සන්ධියට හා ආගම සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) සූර්යෝදය, වියවුල්
(2) නිරවුල්, සූර්යෝදය
(3) වියවුල්, නිරවුල්
(4) වියවුල්, සූර්යෝදය

● අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) අපි එකී අපරාධයට වගකිවයුත්තන් වෙමු.
(2) ඔහු රකුසෙක් මෙන් මා වෙත කඩා පැන්නේ ය.
(3) ලේඛකයා ද ලේඛිකාව ද නවකතා රචනා කරන්නේ ය.
(4) කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වීමට සියල්ලන් ම මුඛ ආවරණ පැළඳිය යුතු ය.

**30.** (1) සියලු ශිෂ්‍යයන් දක්ෂයෝ නො වෙති.
(2) ඇතැමෙක් එකී පනතට විරුද්ධ වූහ.
(3) මඟ දෙපස ඇති වෘක්ෂයෝ සැමට සෙවණ දෙයි.
(4) මන්ත්‍රීවරයා නොහොත් මන්ත්‍රීවරිය සම්මන්ත්‍රණයට සහභාගි වන්නේ ය.

**31.** ● මම ඒ කණුව බිම පතිත වන ............................ බලා සිටිමි.
● රට, ජාතිය, ආගම ............................ වැඩ කිරීම මැනවි.
● එකී පාඨමාලාව ............................ ශිෂ්‍යයෝ ලියාපදිංචි කර ගැනෙති.
● පරාක්‍රමබාහු රජතුමා සිංහයකු ............................ නිර්භීත ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) වෙනුවෙන්, තෙක්, සඳහා, මෙන්
(2) තෙක්, සඳහා, මෙන්, වෙනුවෙන්
(3) සඳහා, මෙන්, වෙනුවෙන්, තෙක්
(4) තෙක්, වෙනුවෙන්, සඳහා, මෙන්

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"ඒකි ළිඳ ගාව උන්න"
(1) ඇය ළිඳ ළඟ සිටියි.
(2) ඈ ළිඳ ළඟ සිටින්නී ය.
(3) ඈ ළිඳ සමීපයෙහි සිටියා ය.
(4) ඇය ළිඳ සමීපයෙහි සිටිති.

**33.** පහත සඳහන් කවි දෙපදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල"

(1) ඉදුණු ගෙඩියක් බටහිර පර්වතයෙන් වැටෙන්නාක් මෙන් රත් පැහැ සූර්ය මණ්ඩලය පෙනේ.
(2) හිරු මඬල බටහිර පර්වතය නමැති නටුවෙන් වැටෙන්නට ආසන්න වූ ඉදුණු තද රතු ගෙඩියක් මෙනි.
(3) ඉදුණු ගෙඩියක් හිරු එළිය වැටීමෙන් රතු පැහැයෙන් පෙනෙන්නේ බටහිර පර්වතයෙන් වැටෙන්නාක් මෙනි.
(4) රතු පැහැ හිරු මඬල බටහිර පර්වතය නමැති නටුවෙන් වැටෙන්නට ආසන්න ගෙඩියක් මෙන් පෙනේ.

**34.** 'ප්‍රබුද්ධ' කාව්‍ය ග්‍රන්ථයේ රචකයා වන්නේ
(1) ගුණදාස අමරසේකර ය.
(2) සිරි ගුනසිංහ ය.
(3) පී. බී. අල්විස් පෙරේරා ය.
(4) මහගමසේකර ය.

**35.** පහත සඳහන් කවියේ හතර වන පදය දැක්වෙන වරණය තෝරන්න.

"රෑ තිස් පැයේ පැල් රැක නිදි මරන්නේ
පාන්දරට යන්තම් ඇස පියෙන්නේ
හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ
........................................"

(1) එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ
(2) හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ
(3) මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ
(4) දෙගොඩ හරිය ගෙවිලා පිනි වැටෙන්නේ

**36.** "දත් දෙපළ සිහින් ය. දීප්තිමත් ය. කපා ඔප මට්ටම් කරන ලද හෙයින් **විදුරුමිණි දෙපළක් මෙන් සිලුටු ය.**"

ඉහත පාඨයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටස

(1) අතිශයෝක්තියකි. (2) රූපකයකි.
(3) උපමාවකි. (4) ස්වභාවෝක්තියකි.

**37.** අසඩක්, නටාලියා, සයිමන් යන චරිත අන්තර්ගත වන නාට්‍යය කුමක් ද?

(1) දුන්න දුනුගමුවේ
(2) තලමල පිපිලා
(3) හුණුවටයේ කතාව
(4) නරි බෑනා

**38.**

"පිරුවානා පොත් වහන්සෙ
කනප්පුවේ පෙරළී ඇත
මිදුල පුරා වියළුණු කොළ
ඒ මේ අත විසිර තිබේ
මිදුලෙ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස් ය
ඉඳහිට ගේ පිළිකන්නේ
බල්ලකු උඩු බුරනු ඇසේ"

ඉහත සඳහන් පද්‍යයෙන් කියැවෙන්නේ,

(1) මරණයක් පිළිබඳ ව ය. (2) අපිරිසිදුකම පිළිබඳ ව ය.
(3) කලහකාරී අවස්ථාවක් පිළිබඳ ව ය. (4) අතීත නිවාසවල ස්වභාවය පිළිබඳ ව ය.

**39.** පතල් කර්මාන්තය ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'සන්නම්' යනු

(1) වටිනා ගල් වර්ග ය. (2) නොවටිනා ගල් ය.
(3) වැඩ කුලිය ය. (4) කුඩයට දමන පස් ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

"පාසලේ අධ්‍යාපනයට ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම ඇතුළත් කිරීම රැකියා අංශයට පිළියමක් ලෙසත් බලපෑවේ ය. මෙය හුදු අත්කම් ඉගැන්වීමක් නොව ශිෂ්‍යයාගේ නිර්මාණශීලීභාවය අවදි කිරීමක් ද විය."

(1) පාසල් අධ්‍යාපනයට ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම ඇතුළත් කිරීම මගින් රැකියා අංශයට විසඳුමක් ලැබුණා පමණක් නොව ශිෂ්‍යයාගේ නිර්මාණශීලීත්වය මතුවීම ද සිදු විය.
(2) පාසල් අධ්‍යාපනයට ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය අධ්‍යාපන ක්‍රම ඇතුළත් කිරීම මගින් රැකියා හිඟය මගහැරුණු අතර අත්කම් ඉගැන්වීමෙන් ශිෂ්‍යයා නිර්මාණකරණයට යොමු කිරීම ද සිදු විය.
(3) රැකියා හිඟයට පිළියමක් ලෙස ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම අධ්‍යාපනයට ඇතුළත් කිරීමෙන් අත්කම් ඉගැන්වීමත් නිර්මාණශීලී ශිෂ්‍යයන් බිහි කිරීමත් සිදු විය.
(4) ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම අධ්‍යාපනයට ඇතුළත් කිරීමෙන් රැකියා හිඟය නැතිවුණු අතර අත්කම් ඉගැන්වීමෙන් ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලීත්වය ද ඉස්මතු විය.

* *

Department of Examinations - Sri Lanka

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2020

| විෂයය අංකය<br>பாட இலக்கம் | 21 | විෂයය<br>பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 2 | 31. | 4 |
| 02. | 4 | 12. | 4 | 22. | 1 | 32. | 3 |
| 03. | 3 | 13. | 1 | 23. | 4 | 33. | 2 |
| 04. | 4 | 14. | 2 | 24. | 4 | 34. | 4 |
| 05. | 2 | 15. | 2 | 25. | 2 | 35. | 2 |
| 06. | 2 | 16. | 4 | 26. | 1 | 36. | 3 |
| 07. | 4 | 17. | 4 | 27. | 3 | 37. | 3 |
| 08. | 1 | 18. | 3 | 28. | 1 | 38. | 1 |
| 09. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 2 |
| 10. | 2 | 20. | 3 | 30. | 2 | 40. | 1 |

Department of Examinations - Sri Lanka

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25/40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25/40 |
|---|---|---|---|

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# IIපත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

ඉගෙනුම් පල -

- අන්තඃස්ථාක්ෂර හඳුනා ගෙන නම් කරයි.
- භාෂා භාවිතයේ දී වචන අර්ථවත් ව යොදයි.
- පද විසන්ධි කිරීමෙන් වචනාර්ථ දැනගනියි.
- තද්ධිත හා කෘදන්ත පද හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.
- උක්තය කර්මය හා ආඛ්‍යාතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
- ක්‍රියා පද හඳුනා ගෙන නම් කරයි.
- විභක්ති අනුව නාම පද නිවැරදි ව යොදමින් ලේඛන කාර්යයේ යෙදෙයි.
- ලේඛනයේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය රීති අනුගමනය කරමින් නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.

Department of Examinations - Sri Lanka

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් අන්තඃස්ථාක්ෂර **දෙකක්** ලියන්න.

(ii) පහත සඳහන් පදවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.

(අ) නල (ආ) නළ

(iii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

(අ) පත්තිරු (ආ) කටුවල

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද **දෙක** උපුටා ලියන්න.

"ඇගේ දිගටි පැහැපත් මුහුණ දුටුවන්ගේ සිත් සතන් ප්‍රබෝධවත් කරයි."

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

(අ) මම උත්සවයට සහභාගි නොවීම මිතුරන්ගේ විමතියට හේතු විය.

(ආ) ගුරුවරයා ළමයෙක් ලවා කවියක් ලියවයි.

(vi) "හංසයන් වැවට **බැස** ඒ මේ අත **පිහිනද්දී** ළමයි සතුටු වූහ." යන වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය ලියන්න.

(vii) පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති ලියන්න.

(අ) තරුණිය **දෙවගනක** මෙන් සැරසී සිටියා ය.

(ආ) පක්ෂියා **අත්තෙන්** අත්තට ඉගිල ගියේ ය.

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) ගංගා මුහුදට වැටෙන ස්ථානය

(ආ) මඩෙහි හට ගන්නා

(ix) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) සම්මාන (ආ) ජනාකීර්ණ

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) පාඨකයෝ ගත් කතුවරුන් අගයති.

(ආ) වෛද්‍ය විශේෂඥයෝ කොවිඩ් රෝගය නිවාරණයට ඖෂධ නිපදවති.

(ලකුණු 02 × 10 = 20 යි)

(i) ය, ර, ල, ව

(ii) (අ) නල - සුළඟ / ගින්න

(ආ) නළ - බටය / නළාව / නළගන / නටුව / නැටුම

(iii) (අ) පත් + ඉරු

(ආ) කටු + අල

Department of Examinations - Sri Lanka

(iv) දිගටි, ප්‍රබෝධවත්

(v) (අ) මා උත්සවයට සහභාගි නොවීම මිතුරන්ගේ විමතියට හේතු විය.

(ආ) ගුරුවරයා ළමයෙකු ලවා කවියක් ලියවයි.

(vi) බැස - පූර්ව ක්‍රියා

පිහිනද්දී - අසම්භාව්‍ය ක්‍රියා (කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා)

(vii) (අ) කර්ම විභක්තිය / කම් විබත්

(ආ) අවධි විභක්තිය/අවදි විබත්

(viii) (අ) මෝය / ගංමෝය / මෝයකට / මෝදර / මුවදොර

(ආ) පංකජ

(ix) (අ) අවමාන

(ආ) ජනශුන්‍ය / ජනහීන

(x) (අ) පාඨකයන් විසින් ගත් කතුවරු අගයනු ලබති / අගයනු ලැබෙති / අගයනු ලබත් / අගයනු ලැබෙත් / ඇගයෙති.

(ආ) වෛද්‍ය විශේෂඥයන් විසින් කොවිඩ් රෝගය නිවාරණයට ඖෂධ නිපදවනු ලබයි / නිපදවනු ලැබෙයි / නිපදවෙයි / නිපද වේ.

Department of Examinations - Sri Lanka

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය - විශ්ලේෂණ හැකියාව හා නිර්මාණාත්මක හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් අපේක්ෂකයා මාතෘකාව සකස් කර ගත යුතු ය.

**ඉගෙනුම් පල -**

- **රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.**
- **රැස් කරගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.**
- **ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි**
- **නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි**

**2.** පහත දැක්වෙන **(අ)**, **(ආ)**, **(ඉ)**, **(ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න. ඔබ **(ඊ)** තෝරා ගන්නේ නම් ඒ යටතේ ඇති විස්තරය ආරම්භය ලෙස යොදා ගනිමින් නිර්මාණාත්මක රචනයක් ගොඩනගන්න.

**(අ)** මත්ද්‍රව්‍ය උවදුර ලෝකයේ බොහෝ රටවල් මුහුණ දෙන ගැටලුවකි. ශ්‍රී ලංකාවේ තරුණ පරපුර ද විවිධ මත්ද්‍රව්‍ය වෙත වේගයෙන් නැඹුරු වෙමින් පවතී. සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්ෂක අංශ මත්ද්‍රව්‍ය වැටලීම් දිනපතා සිදු කළත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් කොතෙක් ක්‍රියාත්මක කළත් එහි අවසානයක් දක්නට නොමැත. රටේ සංවර්ධනයට සෘජු දායකත්වය සැපයිය හැකි ශ්‍රම බලකායේ ශක්තිය වන තරුණ පරපුර මෙසේ විනාශය කරා ඇදී යෑම සංකීර්ණ ප්‍රශ්නයකි.

**(ආ)** ශ්‍රී ලංකාව සියලු දෙසින් ම  ඉන්දියන් සාගරයෙන් වට වී ඇත. ඒ නිසා ඉන්දියන් සාගරයෙන් සෑහෙන ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට අයිති වේ. මත්ස්‍ය සම්පතට අමතර ව විවිධ ඛනිජ ඇතුළු සම්පත් රාශියක් සාගරයෙහි අන්තර්ගත වේ. මේ සම්පත් භාවිතයට ගැනීමෙන් රටේ ආර්ථිකය ශක්තිමත් කළ හැකි ය. එහෙත් අප රට තවම එම සම්පත්වලින් නිසි ඵල නෙළාගෙන නොමැති බව පෙනේ.

**(ඉ)** පාසල් සිසුන්ගේ නව නිපැයුම් පිළිබඳ ජනමාධ්‍යවල නිතර අසන්නට හා දකින්නට ලැබේ. විවිධ වර්ගයේ වාහන, සෞඛ්‍යාරක්ෂණ උපකරණ ආදිය ද මේ අතර වේ. එහෙත් එම නව නිපැයුම් සමාජයට එක්වන්නේ ඉතා අල්ප වශයෙනි. ඊට හේතු වශයෙන් ඔවුන් සඳහන් කරන්නේ එම නිෂ්පාදන  වෙළෙඳපොළට එක් කිරීමේ අපහසුතා පවතින බව යි. එබැවින් මෙම නව නිපැයුම්කරුවන්ට අත දී එම නිර්මාණ රටේ සංවර්ධනයට යොදා ගැනීමට අවස්ථාවක් උදාකර දීම කාලීන සමාජ අවශ්‍යතාවකි.

**(ඊ)** මම හාන්සි පුටුවක දිගා වී නවකතාවක් කියවමින් සිටියෙමි. ටික වෙලාවක් ගත වන විට පොත අතින් ගිලිහී ඇස ද පියවෙනු යන්තමින් මතක ය. මහවනය මැද වැටී ඇති පාරක් දිගේ මම ගමන් කරමින් සිටියෙමි. මඟ දෙපස සත්තු ක්‍රීඩා කරමින් සිටිති. සිංහයෝ සහ ව්‍යාඝ්‍රයෝ මුවන් පිටුපස එළවති. හඳ එළිය ක්‍රමයෙන් පතිත වී ගස් අතුවල කොළ බබළන්නට විය. මා අතරමං වූවා සේ හැඟිණි...

(ලකුණු 25 යි)

(අ) මත් උවදුර තුරන් කිරීමේ අවශ්‍යතාව
මතින් තොර රටක්

(ආ) සාගර සම්පත් කළමනාකරණය කිරීමේ වැදගත්කම
සංවර්ධනයට ජීවය දෙන සාගරය

(ඉ) හෙට ලොව දිනන නව නිපැයුම්
නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ අවශ්‍යතාව
හෙට ලොවට නව නිපැයුම්

(ඊ) මහ වන මැද අතරමං වී
සුන්දර සිහින ලොවක්
සිහින ලොවක අතරමං වී

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.**

| | | | |
|---|---|---|---|
| 01. | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08යි. |
| 02. | සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12යි. |
| 03. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05යි. |

Department of Examinations - Sri Lanka

01. සාරවත්භාවය - ලකුණු 07යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි.
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතුයි**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

* (ඊ) සඳහා පිළිතුර (නිර්මාණය) අතීත කාලයෙන් ලියා තිබුණ ද වර්තමාන කාලයෙන් ලියා තිබුණ ද ලකුණු පිරිනමන්න.

Department of Examinations - Sri Lanka

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 8

| | |
|---|---|
| මාතෘකාව ද සහිතව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම. මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව, සමබව නිවැරදි ව තිබීම. වචන 250ට සමීප ව පැවතීම. | ලකුණු 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළබව තරමක් දුරස්වීම, සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200 ට වඩා අඩු වීම. | ලකුණු 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව නොපැවතීම, වචන ගණන 200ට අඩු වීම. | ලකුණු 4ට අඩු |

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තියක් පිළිබිඹු කිරීම, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල්බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම. | ලකුණු 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් පැවතීම ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම, භාෂා ව්‍යවහාරයේ දුර්වලතා තරමක් පැවතීම. | ලකුණු 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයකර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම,<br>නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම,<br>භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම. | ලකුණු 6-4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා පැවතීම.<br>කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම,<br>නිර්මාණාත්මක බව දක්නට නොලැබීම,<br>නිරවුල් බව නොමැති වීම,<br>භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම. | ලකුණු 3-1 |

03. ශිල්පීය දක්ෂතා ලකුණු 05

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම,<br>පැහැදිලි අත් අකුරු භාවිත කිරීම,<br>විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම,<br>නිවැරදිව ඡේද වෙන් කිරීම,<br>අක්ෂර වින්‍යාසය නිවැරදි වීම. | ලකුණු 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත් අකුරු විරාම දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම. | ලකුණු 4-3 |
| ඉහත දෝෂ බහුල වීම. | ලකුණු 1 |

Department of Examinations - Sri Lanka

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ හැකියාව ද මෙහි ලා විමසීමට ලක් කෙරේ.

ඉගෙනුම් පල -

- ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.
- වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.
- මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි.

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පෘතුගීසි පාලනය පැවති කාලය සාමාන්‍යයෙන් පරම්පරා දෙකකට අයත් වේ. එයින් මුල් පරම්පරාව පෘතුගීසි දිවි පෙවෙතට අකමැත්තෙන් හෝ කැමැත්තෙන් හෝ හුරු ව ජීවත් ව සිටි පිරිස යි. දෙවැනි පරම්පරාව පෘතුගීසි ඌරුවට නිරායාසයෙන් ඇබ්බැහි වී ජීවත් වූ පිරිස යි.

පෘතුගීසීන් ලංකාවේ මුහුදුබඩ පාලන බලය ක්‍රමයෙන් අල්ලා ගෙන අනුගමනය කළ වැඩපිළිවෙළ නම් මෙරට හැකිතාක් පිරිස පෘතුගීසි සිරිත්-විරිත්වලට පුරුදු කරවීම යි. ඒ සඳහා ඔවුහු ආගම උපයෝගි කර ගත්හ. කෝට්ටේ ධර්මපාල රජුත්, යාපනයේ රාජ කුමාරවරුනුත් ක්‍රිස්තියානියට හැරවීම එහි ප්‍රධාන කාර්යයකි. ඒ කාර්යය නිසා කෝට්ටේ රාජ්‍යයේත් උතුරේත් විසූ බොහෝ පිරිස් ක්‍රිස්තියානිය වැලඳ ගත්හ.

සිංහලයන් පෘතුගීසි ජීවිතය පිළිගත් ඒ සැම අවස්ථාවක දී ම කුදුමහත් ඝට්ටන රාශියකට දෙපිරිස ම මුහුණ පෑහ. පෘතුගීසීන්ගේ අදහස් ස්ථිර කරලීමටත්, ව්‍යර්ථ කරලීමටත් වැර දැරූ පිරිස් මෙරට වාසීන් අතර වූහ. පෘතුගීසීන්ට එරෙහි ව සිටි පිරිස් අතර මුල් තැන් ගත්තෝ භික්ෂූන් වහන්සේ යි. ආගමෝන්මාදයෙන් කටයුතු කළ පෘතුගීසීහු සඟ සතු දේපළ හා විහාරස්ථාන පමණක් නොව, හින්දු කෝවිල් ද විනාශ කළහ. පෘතුගීසි ව්‍යාපාරයට සහයෝගය නුදුන් ඔවුන්ගේ පාලනය යටතේ විසුවනට කිසිදු සහනයක් නො ලැබිණි. ඒ නිසා පෘතුගීසි ව්‍යාපාරය නොරිස්සූ ජනයා, විශේෂයෙන් භික්ෂූන් වහන්සේ කෝට්ටේ රාජ්‍යය අතහැර සිංහල රජුට අයත් පෙදෙස් කරා පලා ගියහ. එසේ යා ගත නොහැකිවූවෝ කරදර ගැහැට විඳිමින් තුෂ්ණීම්භූත ව සිටියහ. ඔවුන් කාලයත් සමග අභාවයට යත් ම, ඔවුන්ගෙන් ඇති වූ පිරිසත් පෘතුගීසි ගැති සිංහලයන් ඇතුළු පිරිසත් ඔවුන්ගේ පරපුරත් පෘතුගීසි සිරිත් විරිත් හා පැවතුම් අනුව වෙසෙන්නට පටන් ගති.

(ලකුණු 10 යි)

**සාරාංශකරණය :**

**අන්තර්ගතය**

(i) පෘතුගීසි දිවි පෙවෙතකට හුරුව සිටි පිරිස සහ නිරායාසයෙන් ඇබ්බැහි වූ පිරිස වශයෙන් පරම්පරා දෙකක් එම පාලන සමයට අයත් වේ.

(ii) පෘතුගීසීහු, ආගම උපයෝගි කරගෙන මෙරට හැකිතාක් පිරිස පෘතුගීසි සිරිත් විරිත්වලට පුරුදු කළහ.

(iii) කෝට්ටේ ධර්මපාල රජුත් යාපනයේ රාජකුමාරවරුනුත් ක්‍රිස්තියානියට හැරවීම නිසා කෝට්ටේත් උතුරේත් බොහෝ පිරිස් ක්‍රිස්තියානිය වැලඳ ගත්හ.

(iv) සිංහලයන් සහ පෘතුගීසීන් යන දෙපිරිස ම ගැටුම්වලට මුහුණ දුන් අතර පෘතුගීසීන්ට එරෙහිවූවන් අතර මූලිකවූවෝ භික්ෂූන් වහන්සේ ය.

(v) ආගමෝන්මාදය නිසා පෘතුගීසිහු බෞද්ධ සහ හින්දු පූජනීය ස්ථාන හා දේපළ විනාශ කළහ.

(vi) පෘතුගීසි පාලනය නොරිස්සූ ජනයාත් භික්ෂූන් වහන්සේ බොහෝ දෙනෙකුත් කෝට්ටේ අතහැර පලා ගිය අතර එසේ නොහැකි වූ පිරිස සහ ඔවුන්ගෙන් ඇති වූ පිරිස පෘතුගීසි සිරිත් විරිත්වලට අනුව වෙසෙන්නට පටන් ගති.

**සාරාංශකරණය:**

Department of Examinations - Sri Lanka

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

01. අන්තර්ගතය - ලකුණු 06 යි.
02. වචන ගණන - ලකුණු 02 යි.
03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.

* වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.
* වචන ගණන 60ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
* ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
* එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණ 02කි.
* වචන ගණන 80ට වැඩි කල්හි හෝ 60ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
* දුර්වල සාරාංශ සඳහා බිංදුව නොදී ලකුණු 03ක උපරිමයකට යටත්ව ලකුණු පිරිනමන්න.

සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම ලකුණු 06

| | |
|---|---|
| ප්‍රධාන කරුණු 6ක් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන 65-75 අතර පැවතීම. | ලකුණු 05-06 |
| ප්‍රධාන කරුණු 4-5ක් පමණ ඇතුළත් වීම,<br>වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැකගැනීම,<br>නිරවුල් බව රැකගැනීම,<br>වචන ගණන 55-65 අතර පැවතීම. | ලකුණු 03-04 |
| ප්‍රධාන කරුණු 4ට වඩා අඩුවෙන් ඉදිරිපත් කර තිබීම,<br>වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම,<br>නිරවුල් බව ගිලිහී තිබීම,<br>වචන ගණන 55ට අඩු වීම. | ලකුණු 01-02 |

Department of Examinations - Sri Lanka

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

ඉගෙනුම් පල -

- අවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.
- කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ඈත අතීතයේ සිට ම අප රට පැවතිණැයි සිතිය හැකි නැටුම්, ගැයුම් හා වැයුම් සඳහා කවර ආකාරයක කරළියක් ප්‍රයෝජනයට ගැනිණි දැයි නිශ්චය වශයෙන් කිව නො හැකි ය. එහෙත් පුරාතන පොත්පත්වල සඳහන් වන පරිදි පැරණි ම කරළිය වනාහි රාජ සභා හා දේවස්ථාන ආශ්‍රිත ව පැවති බව නිගමනය කළ හැකි ය. ගැමි කලාවක් වන කෝලම් හෙවත් වෙස් මුහුණු නාටකය රඟ පෑවේ අනුග්‍රාහකයාගේ ගෙමිදුලෙහි තාවකාලික ව තනන ලද එළිමහන් රඟමඬලක ය. ඇතැම් විට ගැමි ශාන්ති කර්මයක් වන ගරායකුමට තනන අයිලයට සමාන වූ තොරණක් රඟමඬල පසෙකින් සාදා තිබිණි. සමහර පාත්‍රයෝ පළමු කොට ම අයිලයට නැඟී සිය වෙස් දක්වා ඉන් අනතුරු ව රඟමඬලට පැන නැටූහ. සොකරි නමින් හැඳින්වෙන ගැමි නැටුම ද එළිමහන් කරළියක රඟ දැක්විණි. බොහෝ විට සොකරි රඟපෑම පිණිස ගොයම් කපා පාගා අවසන් වූ වටකුරු කමත කරළිය වශයෙන් යොදා ගැනිණ. ගැමි නැටුම් ක්‍රමයක් උදෙසා තරමක් දුරට හෝ දියුණුවට පත් වූ රංග භූමියක් පළමු වරට ප්‍රයෝජනයට ගැනුණේ නාඩගම් සම්බන්ධයෙනි. නාඩගම් කරළිය වනාහි එළිමහන් බිමක පොළොවේ මට්ටමෙන් උස් කොට පස් ගොඩගසා ගැනීමෙන් සාදාගනු ලබන අර්ධ කවාකාර ස්ථානයකි. එය අසලින් නළුවන්ට වෙස් මාරුකර ගැනීම පිණිස පොල්අතු සෙවිලි කළ මඩුවක් විය. එහි වහලය ඉදිරියට අවුත් පිටතට නෙරා ආ කරළිය ආවරණය වන අයුරින් ලී කණු දෙකක් මත රැඳී තිබිණි. මඩුවටත් කරළියටත් අතර දෙදෙනකු විසින් හරහට අල්වාගෙන සිටින කඩතුරාවක් විය. නළුවන් මඩුවේ සිට කරළියට පිවිසියේ කඩතුරාවේ එක් පසකිනි.

(i) අප රට පැරණි ම කරළිය කවර ස්ථාන ආශ්‍රිත ව පැවතියේ ද?

(ii) රංගන කාර්යයන් සඳහා එළිමහන් රඟමඬල යොදාගත් අවස්ථා දෙකක් දක්වන්න.

(iii) දියුණුවට පත් වූ රංග භූමියක් ප්‍රයෝජනයට ගැනුණේ කවර නැටුම් ක්‍රමයක් උදෙසා ද?

(iv) රංග භූමිය අසල පොල්අතු සෙවිලි කළ මඩුවක් තැනීමේ අරමුණ කුමක් ද?

(v) මෙහි සඳහන් කඩතුරාව යොදා තිබුණේ කවර ස්ථානයක ද?

(ලකුණු 02 × 5 = 10 යි)

(i) රාජ සභා සහ දේවස්ථාන ආශ්‍රිත ව

(ii) සොකරි, නාඩගම්, කෝලම්

(iii) නාඩගම්

(iv) නළුවන්ට වෙස් මාරු කරගැනීම සඳහා

(v) මඩුවටත් කරළියටත් අතර

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

ඉගෙනුම් පල -

- ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

Department of Examinations - Sri Lanka

**5.** පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන **පුවත්පත් වාර්තාවක්** සකස් කරන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

- '**උදාරගම**' නිතර වැසි ලැබෙන ප්‍රදේශයකි.
- කුඩා වැස්සකට පවා එම ප්‍රදේශය ගංවතුරෙන් යට වෙයි.
- ව්‍යාපාරිකයන් විසින් වගුරුබිම් ගොඩ කරනු ලැබීම ඊට ප්‍රධාන හේතුව යි.
- වැසි ජලය බැස යෑමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීමේ අවශ්‍යතාව දැඩි ව පවතී.
- මේ සඳහා අදාළ බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු ය.

උදාරගම සමූහ වාර්තාකරු සුභානි කරුණාතිලක ඔබ යයි සිතන්න.

**නැතහොත්**

පහත සඳහන් විස්තරය පදනම් කරගෙන **වෙළෙඳ දැන්වීමක්** සකස් කරන්න.

'**සරසි**' වේවැල් භාණ්ඩ අලෙවිසල 2021.07.18 දින සමගිපුර නගරයේ දී විවෘත කිරීමට එහි හිමිකරු සැරසෙයි. නිවසකට අවශ්‍ය මේස, පුටු, රාක්ක, කසළ බඳුන්, විසිතුරු භාණ්ඩ ඇතුළු විවිධ වේවැල් භාණ්ඩ අලෙවිසලේ ඇත. පෙ. ව. 10.00ට විවෘත වන අලෙවිසලෙන් එදින භාණ්ඩ මිල දී ගන්නා පාරිභෝගිකයන්ට 20%ක වට්ටමක් ද පිරිනැමේ. එදිනට පැමිණ වේවැල් භාණ්ඩ මිල දී ගන්නා ලෙස අලෙවිසලේ හිමිකරු සියලු පාරිභෝගිකයන්ට ඇරයුම් කර සිටියි.

(ලකුණු 15 යි)

**පුවත්පත් වාර්තාව**

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි**

1. ආකෘතිය ලකුණු 04 යි.
2. අන්තර්ගතය ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

**1. ආකෘතිය - ලකුණු 04 යි.**

1. මාතෘකාව ලකුණු — ලකුණු 01 යි.
2. වාර්තා කරන්නේ කවුරුන් ද යන වග — ලකුණු 01 යි.
3. යෝග්‍ය ලෙස සිද්ධි ගළපා තිබීම — ලකුණු 02 යි.

**2. අන්තර්ගතය - ලකුණු 08 යි.**

1. උදාරගම ප්‍රදේශයේ ස්වභාවය — ලකුණු 01 යි.
2. නිතර ගංවතුර තර්ජන ඇති බව — ලකුණු 01 යි.
3. ගංවතුරට ප්‍රධාන හේතුව — ලකුණු 01 යි.
4. ගංවතුර තර්ජනයට තවත් හේතු සඳහන් කිරීම — ලකුණු 01 යි.
5. වැසි ජලය බැස යාමට වැඩපිළිවෙළක් නොමැති බව — ලකුණු 01 යි.
6. එබඳු වැඩපිළිවෙළක අවශ්‍යතාව — ලකුණු 01 යි.
7. ඒ සඳහා යෝජනා — ලකුණු 01 යි.
8. බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බව — ලකුණු 01 යි.

**3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.

Department of Examinations - Sri Lanka

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

**නැතහොත්**

**වෙළෙඳ දැන්වීම**

**ලකුණු විග්‍රහය මුළු ලකුණු - 15 යි**

1. ආකෘතිය - ලකුණු 04 යි.
2. අන්තර්ගතය - ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

**1. ආකෘතිය - ලකුණු 05 යි.**

1. ශීර්ෂ පාඨය - ලකුණු 01 යි.
2. පළ කරන්නා - ලකුණු 01 යි.
3. නිර්මාණාත්මකභාවය - ලකුණු 02 යි.

**2. අන්තර්ගතය - ලකුණු 08 යි.**

1. අලෙවිසලේ නම - ලකුණු 01 යි.
2. පැවැත්වෙන ස්ථානය - ලකුණු 01 යි.
3. විවෘත කරන දිනය - ලකුණු 01 යි.
4. විවෘත කරන වේලාව - ලකුණු 01 යි.
5. අලෙවිකරන භාණ්ඩ - ලකුණු 01 යි.
6. වට්ටම් පිරිනැමීම - ලකුණු 01 යි.
7. භාණ්ඩ මිලට ගැනීමට ඇරයුම් කිරීම - ලකුණු 01 යි.
8. ඇරයුම කරන්නේ කවුරුන් ද යන වග - ලකුණු 01 යි.

**3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

* නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු 03කි.

Department of Examinations - Sri Lanka

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# III පත්‍රය

- ❖ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
- ❖ **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ඉගෙනුම් පල -

- නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය හා කතුවරයා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෘතිය නිර්මාණය කළ කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි.**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

Department of Examinations - Sri Lanka

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) "තෝ තමාගේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණ යැ යි සිතයි ද?"
  (අ) මෙම ප්‍රකාශය කළේ කවරකු ද?
  (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.

(ii) දෙදෙන ම ඉඳ දෙ පිට
සවි සත සතන් තුටු කොට
**සුර ගඳබුන් ලෙසට**
පටන් ගෙන වෙණ ගායනාවට
  (අ) පළමු පද්‍ය පාදයේ සඳහන් 'දෙදෙන ම' යනු කවරහු ද?
  (ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පද්‍ය පාදයේ දැක්වෙන කාව්‍යාලංකාරය කුමක් ද?

(iii) "ඔච් ඕකට ගිය කෙනෙක් ආයෙ එන්නෙ නෑ. උඹ පලයන් ළමයා ආපහු ගමට."
  (අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම ලියන්න.
  (ආ) ප්‍රකාශය ශ්‍රවණය කළ අය දැක්වූ ප්‍රතිචාරය කුමක් ද?

(iv) තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ
  (අ) කවියා සඳහන් කරන පරිදි මෙලොවට පලක් වන්නේ කුමක් කළ හොත් ද?
  (ආ) එස්. මහින්ද හිමියන් ලියූ ප්‍රථම කාව්‍ය කෘතිය නම් කරන්න.

(v) (අ) එච්. එම්. කුඩලිගම කවියා අයත් වන්නේ කුමන සාහිත්‍ය යුගයකට ද?
  (ආ) ඔහු ලියූ කාව්‍ය ග්‍රන්ථයක නම ලියන්න.

(vi) සැප සයනා සුවඳ බොජුන්
තුමුල මාලිගා
ඇ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නේ
  (අ) මෙම ප්‍රකාශය කරනුයේ කවරකු විසින් ද?
  (ආ) මෙම පද්‍ය ඛණ්ඩය උපුටා ගත් නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(vii) "නො බව, මහරජ, නො බව මහරජ මෙ දැන් කිහිඹියකු දූ දිවි නොගළවයි. මුහු කෙරෙහි තට භය නැතී"
  (අ) මෙහි 'මුහු' යනුවෙන් හැඳින්වූයේ කවරකු ද?
  (ආ) මෙම ප්‍රකාශය උපුටාගත් මුල් කෘතියේ නම ලියන්න.

(viii) (අ) සියබස්ලකර වනාහි කුමන ග්‍රන්ථයේ අනුවාදයක් ද?
  (ආ) දොළොස්වන සහ දහතුන්වන සියවස් අතර කාලය තුළ ලියවී ඇතැයි සැලකෙන සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය නම් කරන්න.

(ix) පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
.................................................................
රසෙයි අමා රසමය ඒ පියස දුට
  (අ) මෙම කවියේ තුන්වන පදය සම්පූර්ණ කරන්න.
  (ආ) එළු අත්තනගලු වංශය, බුදුගුණ අලංකාරය යන ග්‍රන්ථවල රචකයා කවරෙක් ද?

(x) "හරියට ම මට කියන්න බෑ, ඒ වුණත් මං හිතනවා ජර්මන්කු භාරසීයකින් විතර පිරිමහ ගන්න පුළුවන් වේවි කියලා"
  (අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම කුමක් ද?
  (ආ) මෙම ප්‍රකාශයෙහි සඳහන් වන්නේ කුමක් පිළිබඳ ව ද?

(ලකුණු 02 × 10 = 20 යි)

Department of Examinations - Sri Lanka

(i) (අ) ගිරවා / ගිරා පෝතකයා / ගිරා පණ්ඩිතයා
(ආ) උම්මග්ග ජාතකය

(ii) (අ) ගුත්තිල ඇදුරුතුමා සහ මූසිල
(ආ) උපමාලංකාර

(iii) (අ) පුංචි මැණිකා
(ආ) තමා ආපසු ගමට යන බව පැවසීම

(iv) (අ) තමන් ලැබූ දිවියෙන් කොටසක් රට සමය වෙනුවෙන් පුද කිරීම
(ආ) ඔවා මුතු

(v) (අ) කොළඹ යුගය
(ආ) ඇ / කුණාටුව / එකෝමත් එක රටක / සංවාදය

(vi) (අ) සිංහබාහු
(ආ) එදිරිවීර සරච්චන්ද්‍ර

(vii) (අ) අංගුලිමාල තෙරණුවෝ
(ආ) අමාවතුර

(viii) (අ) කාව්‍යාදර්ශ නම් අලංකාර ග්‍රන්ථය
(ආ) සිදත් සඟරාව

(ix) (අ) දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
(ආ) වීදාගම මෛත්‍රේය හිමි

(x) (අ) ලොයිසල්
(ආ) ගවුමක් මිල දී ගැනීමට වියදම් වන මුදල

Department of Examinations - Sri Lanka

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය

ඉගෙනුම් පල -

- නිර්දිෂ්ට සංදේශවල අර්ථය ලිහිල් බසින් ලියයි.
- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසේ අර්ථය ලිහිල් බසින් ලියයි.
- නිර්දිෂ්ට ගද්‍ය කොටසේ භාෂා භාවිතය පිළිබඳ අදහස් දක්වයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කවි අවබෝධයෙන් යුතුව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- අඟුල් මල් දමනය අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි. (එක් කොටසකට ලකුණු 04 බැගිනි.)**

(අ) කොටස ***ලකුණු 02යි.***
(ආ) කොටස ***ලකුණු 02යි.***

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට
**දුලබ** ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
**කිරඹ** පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) මෙහි සඳහන් විහාරයේ ස්වරූපය විස්තර කර ඇත්තේ කෙසේ ද?

(ii) ''පිටැ බඳිනා ලද **හියොවුරු** ඇති වැ නැඟෙන ලද ධනුර්ධරයන් විසින් **උපලක්ෂිත** වූ සේනා නමැති සමුද්‍රයෙන් නැංගා වූ මහ තල්මස් කැල සේ රිය සකින් රිය සක ගසා සිටුවන ලද රථ වළල්ලෙකින් ද....''

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි දැක්වෙන රූපකය සහ උපමාව උපුටා දක්වන්න.

(iii) පුන් මදාරා මල් දමින් මුදු
දිගු සුනිල් වරලස ගොතා
මන් මදා කිතු ලිය ලෙසින් උර
තුර සරා දිලි මුතු ලතා
මන් නදා වන මිණි මෙවුල් නද
වෙණ නදින් එක් කොට ඉතා
**උන් එදා දුන් රග දුටොත් තව**
**සක් සැපත් කවරෙක් පතා**

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පද්‍ය පාදයේ අර්ථය ලියන්න.
(ආ) මෙහි දැක්වෙන නාටිකාංගනාවන් වරලස සහ උරය සරසා ගත් ආකාරය දක්වන්න.

(iv) ''සොර දූ එ සමාහි **දුබ්භොජනයෙනුදු** දුක්ඛසෙය්‍යායෙනුදු උකටලි වී. ඔහු මැරු මිනිස්හු එකක්හු උනු දහසක් දෙන යැ. හෙ වනාහි ''එකකු විසින් දහස සපිරෙ'' යි යන සිත් ඇති වැ ''යමක්හු පළමු දිටිම් ද, ඔහු මරා ගණන් සපුරමි. ශිල්පයට උපචාර කොටැ ඇළි කප්වා නහා **පිළී පෙරළා** මවුපියන් දක්මි''

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) සොරා උකටලී වීමට හේතුවත් ශිල්පයට උපචාර දැක්වීම සම්පූර්ණ කිරීමට සිතූ ආකාරයත් කෙටියෙන් ලියන්න.

(v) අයි රාවණ වුවත් නවතන රිසින් එන
අයි රා දහස් දිලි **දුනු කොත් සිපත්** ගෙන
කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින
**වයි යා කරන්** මල් තුරු ගන වන හිසින

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) කයිකාවලෙහි ආරක්ෂක විධිවිධානවල ශක්තිමත් බව කවියා විස්තර කර ඇත්තේ කෙසේ ද?

(ලකුණු 04 × 5 = 20 යි)

(i) (අ) දුලබ - දුර්ලභ

කිරඹ - කිරිවතුර

(ආ) මහී කාන්තාවගේ මුහුණ මෙන් නිතර බබළන ඉතා දුර්ලභ ඉසුරින් පිරුණු විහාරයකි.

(ii) (අ) හියොවුරු - හී කොපු

(ආ) උපලක්ෂිත - අලංකාර වූ

(iii) (අ) නාටිකාංගනාවන් එදා දුන්නා වූ රංගනය දුටුවොත් ශක්‍ර සම්පත්තියක් කවරෙක් පතත් ද?

(ආ) පිපුණු මදාරා මලින් මෘදු වූ, දික් වූ, ඉතා නිල් වූ, කෙස් කලඹ ගොතා ගෙන අනංගයාගේ කීර්තිලතා මෙන් දිලිසෙන්නා වූ, මුතුවලින් ළය මැද සරසා ගෙන

(iv) (අ) දුබ්භොජනයෙනුදු - නපුරු ආහාරයෙන් ද / කටුක ආකාරයෙන් ද

පිළි පෙරළා - ඇඳුම් මාරු කොට



Department of Examinations - Sri Lanka

(ආ) නපුරු ආහාරයෙන් සහ දුක් සහගත නිදීමෙන් උකටලී විය.
දහස සම්පූර්ණ කිරීමට තවත් එක් අයෙකු මැරීමට අවශ්‍ය හෙයින්, පළමු දුටු කවරෙකු හෝ මරා ගණන සපුරා ශිල්පයට උපචාර කිරීමට සිතීය.

(v) (අ) දුනු කොත් සිපත් - දුනු ද කුන්ත ද කඩු ද
වයි යා කරන් - වහා / වේගයෙන් / හයියෙන් පියාසර කරන්න.

(ආ) ඉදිරියට එන අයිරාවණ ඇතා වුවත් නවත්වන අදහසින් දහසකට වැඩි දිලිසෙන දුනු, කුන්ත, කඩු රැගෙන කයිකාවල නම් ස්ථානයෙහි සිටිමින් සෙබළුන් මුර කළ බව.

**ප්‍රශ්න අංකය 03**

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

ඉගෙනුම් පල -

- අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය ගැන සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට පෙළ රස විඳිමින් විචාරය කරයි.
- නිර්දිෂ්ට සංදේශ කවිවල කාව්‍යෝපක්‍රම හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට සංදේශ කවි රස විඳිමින් විචාරය කරයි.

**ලකුණු විග්‍රහය** - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - **ලකුණු 15යි.**
5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුයි. - **ලකුණු 10යි.**

3. • මනා චරිත නිරූපණයත්
• අවස්ථා හා සිද්ධි ගැළපීමත්
"උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව" කථාවේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

• ස්වාභාවික පරිසරයේ චමත්කාරයත්
• සුලලිත පද සංඝටනයත් නිසා
සැළලිහිණි සංදේශය පාඨක සිත් අමන්දානන්දයට පත් කරයි.
නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

- **මනා චරිත නිරූපණය**

උග්ගසේන සිටුපුත්

* දැඩි සිත් ඇත්තෙකු ලෙස අධිෂ්ඨානයෙන් යුක්ත ව ක්‍රියා කිරීම
"ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි සිතා ..."
"නෑයන් සියන් නො එක් ලෙසින් නැවතුවත් සිතා ගත් සිතිවිල්ල පිරිමැසූ බව මුත් කාරිය නොසලකා ..."

* තමාගේ අභිමතාර්ථ සාධනයේ දී ආත්ම විශ්වාසයෙන් යුක්ත ව කටයුතු කිරීම

* ශිල්ප ඉගෙනීමට යොමු වීම
  "ඇගේ ඒ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි"
* තමා දන්නා ශිල්ප ප්‍රදර්ශනය කිරීමට පසුබට නොවීම
  "රජගහ නුවර උපන් වැඩී නුවර නොවේ දැයි ලජ්ජාවෙන් වළහාත් නොපියා ඊටත් අවුත් ..."

* දැඩි චිත්ත ධෛර්යයෙන් යුක්ත වීම නිසා රහත්භාවයට පත් වීම
  "... හුණදඬු අග දී පිළිසිඹියා පත් රහත් ව හුණ දණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොසින් ..."
* උග්ගසේනයන් විද්දත් දූ ගේ රූප සම්පත්තියේ බැඳීම හාස්‍යයෙන් යුක්ත ව දැක්වීම
  "රූප කලාප විකාරයක් බලවත් නියා යයි නො සිතා ඈ කෙරෙහි බලවත් වූ ප්‍රෙම ඇති ව ..."
* ශිල්ප නොදත්තෙකු ලෙස අපහාසයට පත් කිරීම
  "... කුමකුත් නො දත්තවුගේ පුතැ ය" කිය කියා නළවයි.
* උග්ගසේන චරිතය අනුකම්පාවට ලක් වීම
  "සිටු පුත්‍රයාණන් දන්නා විද්දත් ශිල්පයක් නැතත් ඒ දෙය මේ දෙය අල්වා ගන්ට වුවත් සහායක් වුවමනා හෙයින් දුවණියන් පාවා දී ලා ..."

විද්දත් දියණිය

* උග්ගසේන සමග ඇති වූ විවාහයෙන් අනතුරු ව විද්දත් දියණියගේ නොසලකා හැරීම සහ අනුකම්පා විරහිත ප්‍රකාශ
  "ගැල් රකිනවුගේ පුත බර උසුලන්නවුගේ පුත"

* තමා දන්නා ශිල්ප හමුවේ අභිමානයෙන් යුක්ත වීම
  "රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය"

* ස්වාමි භක්තියෙන් කටයුතු නොකිරීම
  "තොප ගිය මැන, හුත මැනව තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් දැ?..."

විද්දත් ශිල්පියා

* ආත්මාභිමානයෙන් යුක්ත වීම නිසා තම දියණිය සිටු කුලයට පාවා දීමට අකමැති වීම
  "ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙන නො දෙමි"

* තම දියණිය හා විවාහ වීම අවශ්‍ය නම් සිටු පුත්‍රයාට තම කුලයට පැමිණෙන ලෙස පැවසීම
  "අප හා එක් වන්නා ම දුව පාවා දෙමි"

* ආත්මාර්ථකාමී නොවී තමා දන්නා ශිල්ප උග්ගසේනයන්ට ලබා දීමට මැලි නොවීම
  "මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන ගෙන"

උග්ගසේනයන්ගේ දෙමාපියන්

* තම පුතු කෙරෙහි දක්වන දැඩි ස්නේහය
  "පුත තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නො වෙයි. තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙම්හ ..."

* පුතාගේ අභිප්‍රාය ඉටු කිරීමට පියවර ගැනීම
  "උන්ගේ යාළුවාණන් ද කැඳවා ලා මසුදාසක් දී ලා තෙල අහස සිට නැටූ විද්දත් දුවගේ පියාට දීලා තමාගේ දුව ම පුතුන්ට පාවා දෙන්ට කියව ..."

- **අවස්ථා හා සිද්ධි ගැළපීම**

* උග්ගසේන සිටු පුත්‍රයා නැටුම් නරඹන විට විද්දත් දියණිය කෙරෙහි වශීකෘත වූ අවස්ථාව
  "විද්දත් දුවගේ හාවභාව ලීලා දක වායොධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නිසා ය යි නො සිතා ඈ කෙරෙහි බලවත් වූ ප්‍රේම ඇති ව"

* විද්වත් දියණිය කෙරේ ආලයෙන් මුසපත් ව, නිරාහාරව, පරපීඩිත ව සිටින උග්ගසේනගේ සැබෑ ස්වරූපය ඉදිරිපත් කළ අවස්ථාව
  "ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමී' සිතා ගෙන නො කා නො බී හැඳට නැඟී ලා වැද හොත්තාහ"

* පුතු කෙරෙහි ඇති ස්නේහය නිසා පුතුගේ අභිප්‍රාය ඉෂ්ට කර දීමට දෙමාපියන් කටයුතු කරන ආකාරය
  "තෙල අහස සිට නැටූ විද්දත් දුවගේ පියාට දී ලා තමාගේ දුව ම පුතුන්ට පාවා දෙන්ට කියව"

* තම දියණිය සිටු පුත්‍රයාට විවාහ කර දීම සම්බන්ධ කාර්යයේ දී විද්දත් ශිල්පියා හැසිරෙන ආකාරය
  "නොලදොත් මියෙත් නම් මිය ප්‍රයෝජන කිම් ද? අප හා එක් වන්නා ම දුව පාවා දෙමි"

* ශිල්ප නොදන්නාකම නිසා ම විද්දත් දියණිය උග්ගසේන පිළිබඳ ව දැඩි ලෙස කලකිරී උපහාසයට පත් කළ අවස්ථාව
  "ගැල් රකිනවුගේ පුත බර උසුලන්නවුගේ පුත"

* මයිලණුවන් කරා ගොසින් ශිල්ප උගත් උග්ගසේන රජගහ නුවරට ද පැමිණීමේ සිද්ධිය.
  "මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන ගෙන පයි ඇදීමෙන් හැරී ගොසින් රට මුළුල්ලේ ශිල්ප පෑ ගෙන ඇවිදිනෝ"

* උග්ගසේන සිටුපුත් අරමුණු කර ගෙන බුදුරජාණන් වහන්සේ රජගහ නුවරට වැඩම කිරීම
  "එදවස් බුදුහුත් අලුයම් වේලේ ලොව බලන සේක් හුණදඬු අගට නැඟෙන්නාට පෙරාතු ව ..."



Department of Examinations - Sri Lanka

* උග්ගසේන සිටුපුත් රහත්භාවයට පත් වීම
  “හුණදඬු අග දී පිළිසිඹියා පත් රහත් ව හුණදණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොසින් පසඟ පිහිටුවා වැඳ ගෙන මහණ කරන්ට ආරාධනා කළහ”

* උග්ගසේනයන්ගේ කර්ම විපාක පෙන්වා දීම සඳහා අතීත කතාව දැක්වීම
  “ගිය දවස කසුප් බුදුන්ගේ රන් දා ගැබ කරන කල්හි”

**නැතහොත්**

ස්වාභාවික පරිසරයේ චමත්කාරයත්, සුලලිත පද සංඝටනයන් නිසා සැළලිහිණි සංදේශය සාර්ථක කාව්‍ය නිර්මාණයක් වී ඇති අයුරු පහත සඳහන් නිදසුන් දක්වමින් විස්තර කර තිබීම අපේක්ෂිතය.

- **ස්වාභාවික පරිසරයේ චමත්කාරය**
  * වලඳින අඳහසින් මෙන් සුර ගඟ අඟන .....
  * අග පිපි මල් මලිගිය ලිය කැලේයා .....
  * නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ .....
  * මඟ නිලමින් සිටිනා දොඹ නී පියල .....
  * රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවැසී .....
  * වන සිරි පියුම්රා බඳ රන' බරණ යුරු .....

- **සුලලිත පද සංඝටනය**
  * නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
  * ගනේ මිණි බැබළි කිරණෙව් සතපාය
  * අග පිපි මල් මලිගිය ලිය කැලේයා
    වග බැඳ හෙන රජ හස පුල් විලේයා
  * කස්තුරි තිලක සැදි නළලත සුමටාන
    පුල් මහනෙල් මල් දම් හිස දවටාන

  * මඟ නිලමින්
    පිය සලමින්
    තතු ඬලමින්
    ඉසි ඹුලමින්

  * රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවැසී
    මත කොවුලේ තුරු වදලේ හඬන නිසී

Department of Examinations - Sri Lanka

**ප්‍රශ්න අංකය 04**

ඉගෙනුම් පල -

* දියමන්ති මාලය කෙටි කතාව රස විඳිමින් විචාරය කරයි.
* දැතේ කරගැට නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.

4. ● මැටිල්ඩාගේ චරිතයත්
   ● ෆොරෙස්ටියර් මහත්මියගේ චරිතයත්
   මගින් සමාජ පන්ති දෙකක යථා ස්වභාවය මනාව නිරූපණය කිරීමට දියමන්ති මාලය කෙටිකතා රචකයා සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

   **නැතහොත්**

   ● සරල බස්වහරත්
   ● උචිත කාව්‍යෝපක්‍රම යොදා ගැනීමත්
   "දැතේ කරගැට සිඹ සනසන්නට" කවි පෙළ කෙරෙහි පාඨක සිත් ඇදී යාමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

**මැටිල්ඩාගේ චරිතය:-**

පහළ මධ්‍යම පන්තිය නියෝජනය කිරීම නිසා වත්කම් අහිමි වීම :-

"එහෙයින් ඇය අධ්‍යාපන අමාත්‍යංශයේ සුළු ලිපිකරුවකුට තමා විවාහ කර දීමට ඉඩ හැරියා ය."

● අවම වශයෙන් හෝ භෞතික සැප සම්පත් සම්පූර්ණ නො වීම

"නිවසේ දිළිඳු අසරණකමින්, එහි බිත්තිවල කාලකණ්ණි දුක්බර පෙනුමෙන්, දිරා ගිය පුටුවලින් හා අවලස්සන දොර ජනෙල් රෙදිවලින් ....."

● මූලික අවශ්‍යතාවලට පමණක් මුල් තැන දීම

"ඉතින් මොකක් ද, මට තියෙන්නෙ ඇඟේ දා ගෙන යන්න ඔයි වගේ තැනකට?"

"නෑ මොකුත් නෑ. මට අඳින්න ඇඳුමක් නෑ. ඒක හින්දා ඔය පාටියට යන්න බෑ."

● විලාසිතා මත පන්තිය තීරණය කිරීම

"ඇයට ඇඳුම් පැලඳුම් හෝ මුතු මැණික් හෝ කිසිවක් නො තිබුණේ ය.

"මං නිකම්ම නිකම් මොකුත් ම නැති එකියක් වගේ පෙනේවි, පාටියට නො යනවා නම් වැඩිය හොඳයි කියලත් මට හිතෙනවා."

"නෑ.... පොහොසත් ගෑනු මැද්දෙ දුප්පත් විදියට ඉන්න එක තරම් ලැජ්ජා නැති වැඩක් නෑ"

"ආපසු යෑමට සැරසෙත් දී ඔහු ගෙනවුත් තිබූ බ්ලැන්කේට්ටුව ඇයගේ කර වටා දමා පෙරවී ය. සාමාන්‍ය ජනයාගේ දිළිඳු පොරෝනයක් වූ එයත් නැටුම් උත්සවයට ඇඳ සිටි සාඩම්බර ඇඳුමත් අතර වූ වෙනස කැපී පෙනිණි."

ධනවත් පන්තිය ඇසුරු කිරීමට ඇති කැමත්ත

Department of Examinations - Sri Lanka

"සෑම ගැහැනියක ම ඊර්ෂ්‍යා පරවශ වූත්, ප්‍රාර්ථනීය වූත් සිතින් ආශ්‍රය කිරීමට ආශාවෙන් සිටින චිර ප්‍රසිද්ධ මිනිසුන්ගෙන් සැදුණු ඉතා විශ්වාසී මිතුරන් ස්වල්ප දෙනෙකුගේ ප්‍රිය සමාගමය .... ඒවා පිළිබඳ කල්පනාවෙන් මනෝලෝකයක ජීවත් වූවා ය."

**ෆොරෙස්ටියර්ගේ චරිතය:-**

* ඉහළ මධ්‍යම පන්තිය නියෝජනය කරමින් අරුමෝසම් දැකුම් ඇති විලාසිතාවලට හුරුවීම හා තම ධනවත්කම ප්‍රදර්ශනය කිරීම.

 "ෆොරෙස්ටියර් මහත්මිය කණ්ණාඩි මේසයෙන් විශාල ස්වර්ණාභරණ පෙට්ටියක් එළියට ගෙන ලොයිසල් මහත්මිය වෙත එය ගෙන ආවා ය."
 "ඇයි මේ තව තියෙන්නේ, හොඳට බලන්නකො අනේ. ඔයාගෙ හිතට මේවායින් මොකක් අල්ලයි ද කියලා නම් මට කියන්න බෑ"

* සුඛ විහරණයෙන් යුතු ජීවිතයක් ගත කිරීම
 "කුඩා දරුවකු අතින් අල්ලා ගෙන ගමන් කරමින් සිටි ස්ත්‍රියක් හදිසියේම දකින්නට ලැබුණා ය. ඒ ෆොරෙස්ටියර් මහත්මිය වූවා ය. ඇ එකල තරුණ වියේ සිටි අන්දමින් ම යොවුන් බවින් යුතු ව රූමත් ව සුන්දර ව සිටියා ය."

* පුහු ආටෝපයෙන් යුත් ජීවිතයක් ඔවුන් ගෙවන බව පිළිබිඹු වීම.
 "කළු සැටින් පෙට්ටියක බහන ලද ඉතා විචිත්‍ර දියමන්ති මාලයක් දුටුවාය."
 "අනේ, මගේ අසරණ මැටිල්ඩා ! මගේ ඒ මාලේ බොරු දියමන්ති මාලයක් ! හොඳට ම වැඩි වුණොත් ඒක වටිව් ෆ්‍රෑන්ක් පන්සීයක්"

**නැතහොත්**

**සරල බස්වහර**

- ගැමි වහර රසවත් ව යොදා ගැනීම

 "දෑතේ කරගැට සිඹ සනසන්නට
 ළා ගොයමේ දලු පවන් සලයි"

 "මා ගත වෙහෙසට ආදරයෙන් දිය
 උල්පත පාදන පුංචි පුතුන්"

- බස සරල ව යොදා ගැනීම
 "දෙදහස් පන්සිය වසරක් තිස්සේ
 මා දුටු සිහිනය පුංචි පුතුන්
 ණය නැති බිය නැති නිවහල් යුගයක
 පුංචි පුතා රජ කරනු පෙනේ"

Department of Examinations - Sri Lanka

## උචිත කාව්‍යෝපක්‍රම යොදා ගැනීම

- රූපකාර්ථ භාවිතය

"දහදිය මුතු ඇට මල් වරුසා වී
මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත පාදන පුංචි පුතුන්"

- සංකේත භාවිතය

"සත් රුවනින් නව නිදහන් මතු වී"
"හෙට හිරු එළියට වඩින දිනේ"
"අඩ සඳ මෝරන මැදියම් අහසින්"
"බිළිඳු හදට කිරි දියර ගලයි"

- ව්‍යංගාර්ථ භාවිතය

"හෙට ඉදිවන නව ලෝකය දැක දැක
පුංචි පුතා හීනෙන් හිනැහෙයි"
"දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇත මවු දෙරණේ"

- භාවාර්ථ යෙදුම් භාවිතය

"දැසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ"

"දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදිකර දී මිස
යා නොහැකි ය මට පුංචි පුතුන්"

Department of Examinations - Sri Lanka

- ආකෘතිය :-

* එළිසම විරහිත සිවු පද කාව්‍යය

- අනුප්‍රාසමය යෙදුම් භාවිතය :-

  "හෙට ඉදිවන නව ලෝකය දැක දැක
  ණය නැති බිය නැති නිවහල් යුගයක"

❖ **3, 4 පිළිතුරු සඳහා උදාහරණ 4ට ලකුණු 04 යි.**
**විස්තරයට ලකුණු ලකුණු 11 යි.**

**මුළු ලකුණු 15 යි.**

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**ප්‍රශ්න අංකය 05**

ඉගෙනුම් පල -

- ජන කවි හා බැඳුණු ගැමි සංස්කෘතික ලක්ෂණ අගය කරයි.
- නිර්දිෂ්ට ජන කවි රස විඳිමින් විචාරය කරයි.

5. වගා කටයුතුවල දී ගොවි ජනයා මුහුණපාන දුෂ්කරතාව කවියට නැගීමෙහි ලා ජන කවියා දක්වන සංවේදීභාවය "කුරහන් ඉසිමුව කළුවර බලාලා" යන කවි පෙළෙන් මනා ව නිරූපිත ය. උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**වගා කටයුතුවල දී ගොවි ජනයා මුහුණපාන දුෂ්කරතාව**

* ගොවියාට වගා කටයුතු ආරම්භයේ දී ඒ සඳහා මාස තුනක පමණ කාලයක් ගත කිරීමට සිදු වීම

  "දුරුතු මහේ දී කැලයට වැදීලා"

* වගාවට සිවුපා සතුන්ගෙන් නොයෙකුත් කරදර සිදු වීම.

  "කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම"

* කුරහන් හේන රැක ගැනීමට වගාවේ මුල් අවස්ථාවේ සිට ම නිදිවර්ජිත ව කටයුතු කිරීමට සිදු වීම

  "ඇහැට වෙහෙස ඇත තුන් යමට නිදි නැති
  ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති"

* පීදීගෙන එන කුරහන් කරල් කෑමට ඌරන් රංචු පිටින් පැමිණීම නිසා දුෂ්කරතාවට පත් වීම

  "හේනේ පැලේ මා විඳිනා සුරැක්කන්
  ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන් "

Department of Examinations - Sri Lanka

* හේන රැක ගැනීමට ගොවියා දක්වන අපමණ උත්සාහය සංවේදී ව දැක්වීම

"අපොයි මගේ කිරි වදිනා කුරක්කන්

ඌරෙනි නොකා පලයව් මගෙ කුරක්කන්"

* වගාව නිසරුවීම නිසා ලෝකයාගෙන් එල්ල වන බලපෑම් හමුවේ ගොවියා දුෂ්කරතාවට පත්වීම

"එපෙති වෙන්ඩ කවුදැයි කළ නරක්කන්"

**ප්‍රශ්න අංකය 06**

ඉගෙනුම් පල -

- නාට්‍යපෙළෙහි නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**6.** සුප්පා දේවියගේ චරිතයෙන් නිරූපණය වන්නේ තම දරුවන්ගේ උන්නතිය වෙනුවෙන් කැපවන මවකගේ ස්වරූපය යි. නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

Department of Examinations - Sri Lanka

* දරුවන්ට නිවැරදි අවබෝධයක් ලබා දීමට පියාගේ සත්‍ය තත්ත්වය දරුවන්ට හෙළි කිරීම

"සඟවන්නට තතු බැරි ය පුතුගෙන්

මිගිඳා නිතින සොඳිනා පෙනෙන විලසා

අදහන්නෙ නැත කීව ද මුසා

නැණ මූකුරා ගොස් ඇත පුරා වයසා"

* අපමණ බාධක මැද දරුවන් වෙනුවෙන් සිය යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම

"ඔබ පාමුල හිඳුවා මා

වැඩෙන වයසෙ දී

රාජකතා කී විසිතුරු

දැන් සිහි වන්නේ"

* අසීමිත පතිභක්තියෙන් සිටි සැමියාව දරුවන් නිසා හැරදා යාම

"දෙවියන් බාරයි මා සමිඳා

මා වෙත නොවනුය කෝපා

දරුවන් සන්දා

කරනෙම් මෙබන්දා"

* තම ලෝකය ලෙනක කොටු වුවත් දරුවන් ඒ ලෝකය තුළ සිරකරුවන් නොවිය යුතු බව සිතා කටයුතු කිරීම

"දරුවන් දෙදෙනා

හට සෙත් ලැබෙනා

මග ඔස්සේ යා යුතු වන්නේ

නොසැලී කිසි මෙම වේලේ"

* දරුවන් රාජකීය උරුමයන් ගැන දැනුවත් කරමින් ඒවා සොයා යෑමට මග පෙන්වීම
  "මැණිය නුඹ දෙදෙනගෙ වේ
  කුමරියක් මනා
  පසිඳු මහගු වංග දේසෙ
  නරවර හට දා"

* දරුවන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් අසීරු දුෂ්කර තීරණ ගන්නා බව පුනා පුනා ප්‍රකාශ කිරීම
  "දරුවන් දෙදෙනා
  හට සෙත් ලැබෙනා"
  "දරුවන් සන්දා
  කරනෙම් මෙබන්දා"
  "නුඹගේ ද නුඹ නැගණියන්ගේ ද යහපත පිණිස මම නුඹ පියාණන් හැරපියා යන්ට සනිටුහන් කර ගතිමි."

**ප්‍රශ්න අංකය 07**

ඉගෙනුම් පල -

- **කවියා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.**
- **නිර්දිෂ්ට පද්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.**

7. වීණා වාදනයේ මිහිරිබව තීව්‍ර කොට දැක්වීමට ගුත්තිල කවියා, රැස්වූවන්ගේ ප්‍රතිචාර යොදාගත් ආකාරය නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

* වීණා වාදනයේ මිහිරි බව දැක්වීමට විවිධ අවස්ථා නිරූපණය කරමින් රැස්වූවන්ගේ ප්‍රතිචාර දැක්වෙන කවි නිදසුන් වශයෙන් දක්වමින් විස්තරාත්මක ව ඉදිරිපත් කොට ඇත්නම් ඉහළ ලකුණක් පිරිනමන්න.

- **මනුෂ්‍යයන්ගේ ප්‍රතිචාර**

* සෙබළුන් අතින් අවි ගිලිහී යාම
  "නිති නිරිඳුගේ රැකවලෙහි නියුත්තෝ
  අති නවි ගිලිහෙන බව නොම දත්තෝ"
* පුර කාන්තාවන්ගේ උකුළේ රැඳී සිටි දරුවන් බිමට වැටීම
  "නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා"

- සත්වයන්ගේ ප්‍රතිචාර

* ඇත් සේනාව සිතුවම්වල ඇතුන්ගේ ස්වභාවය ප්‍රකාශ කිරීම
  "ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී"
* අශ්ව සේනාව පිළිරූ මෙන් නිසොල්මන් ව සිටීම
  "සන්සල නොව එහි පිළිරූ ලෙසිනේ"
  නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ"



Department of Examinations - Sri Lanka

* මාළු රංචුව මිනිසුන් දුටුවත් නොබිය ව ගං වෙරළට රැස්වීම
  නන් දන කැන් දුටුව ද බිය සිස්වූ
  මින් රළවුත් ගං වෙරළට රැස්වූ
* පක්ෂි සමූහයා පියාසර කිරීම අත්හැරීම
  "සර හැර සියොතුන් පියපත් විදමිනි"
* රිළා රංචුව එකඟ වූ සිත් ඇති ව පරම්පරා දුර්ගුණය අත හැරීම
  "එදා ගියේ රිළවුන් සන්සල බව"
* මොනර සමූහයා ආහාර සොයා නොයාම
  "නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට"
* නාගයන් හා ගුරුළන් අතර ඇති වෛරය අමතක වී යාම
  "එදින වෛර සිත සිහි නො කළෝයා"
* කිඳුරු සමූහයා වන්දිභට්ටයන්ගේ ස්වරූපය ගැනීම
  "වැදි දන සිරි ගත්තුය කිඳුරෝයා"
* ගිරවුන් ආශාවෙන් ගත් මී අඹ ඉවත දැමීම
  "උමුවෙන් ගත් මී අඹ මියුරායා
  දැමුවෙන් වෙණ නද ම ය මියුරායා"
  * මුව රංචුව මිනිසුන් හමුවූවත් බිය නොවීම
    "සිතිවිලි නැති රූ විලඝ මුවෝයා
    තැති නොගනිති මිනිසුන් සමුවෝයා"

- සුරංගනාවන්ගේ ප්‍රතිචාර
  * නවසියයක් සුරගනන් නර්තනයේ යෙදීම
    "තුටන් වඩන සුර අඟනෝ බැස සිට
    පටන් ගත්තු නව සියයක් නැටුමට"

❖ **5,6,7 පිළිතුරු සඳහා උදාහරණ 3ට** **ලකුණු 03 යි.**
**සමස්ත විස්තරයට ලකුණු** **ලකුණු 07 යි.**
**මුළු ලකුණු 10 යි.**

Department of Examinations - Sri Lanka